# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1793/7 – 2013 ජනවාරි 16 වැනි බදාදා – 2013.01.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ යොමු අංකය: T23/Co/95/95(උප).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

රංජිත් ලියනගේ මයා, අංක 104/6 බී, ටෙම්ප්ලර්ස් පාර, ගල්කිස්ස.

සහ

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

බොරලැස්ගමුව, පිරිවෙන පාර, නො. 128 හි එස්. විරිතමුල්ල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 ජනවාරි මස 08 වැනි දින,
කොළඹ දී ය.

---

1A – G 17159 – 430 (2013/01)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ යොමු අංකය: T23/Co/95/95/(උප).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

රංජිත් ලියනගේ මයා, අංක 104/6 බී, ටෙම්ප්ලර්ස් පාර, ගල්කිස්ස.

සහ

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

01. රාජ්‍ය මැණික් සංස්ථාවේ කළමනාකරන සැපයීම් (III ශ්‍රේණිය) වශයෙන් සේවය කළ රංජිත් ලියනගේ මහතා 1994 වර්ෂයේ එම සංස්ථාව, අධිකාරියක් බවට පත් කිරීමේදී පොදු වන්දි ක්‍රමය යටතේ සිය කැමැත්තෙන් සේවයෙන් ඉවත් වීමට කැමැත්ත ප්‍රකාශ කිරීම මත ගෙවිය යුතු වන්දි ප්‍රමාණය ගණනය කිරීමට බුළුමුල්ල වන්දි ක්‍රමය උපයෝගි කර ගැනීමෙන් ඔහුට අසාධාරණයක් සිදුවූයේද යන්න හා

2. සේවක අතිරික්ත පදනම මත අතිරික්ත සේවකයකු සේ සලකා වයස එළඹීමට ප්‍රථම ඔහුට සේවක අර්ථසාධක මුදල් ද මුදාහැර ඇති බැවින්, රංජිත් ලියනගේ මහතාගේ අවුරුදු 22ක සේවා කාලය සලකා ඔහුට මාස පනහක වන්දි මුදල හිමිද යන්න හා වෙනත් සහන මොනවාද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 දෙසැම්බර් මස 03 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

02 - 41

---

මගේ යොමු අංකය: IR/10/49/2008.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත් වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම.

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියැවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වැනි වගන්තිය යටතේ 2012 මාර්තු මස 14 වැනි දින අංක 1749/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2012 පෙබරවාරි මස 28 වැනි දින දරන නියෝගයෙන්,

එක් පාර්ශවයක් වශයෙන්,
එස්. විතානාච්චි මයා ඇතුළු සේවකයින් 47 දෙනා, 'කෙත්සිරි' තිබ්බොටුවාව, කහදූව.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්,
ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

අතර පවත්නා 2012 පෙබරවාරි මස 03 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එම්. ඩී. කේ. කුලතුංග මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය වන ගාමිණී ලොකුගේ වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2012 පෙබරවාරි මස 28 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 ජනවාරි මස 08 වැනි දින,
කොළඹ දී ය.

02-42/1

මගේ යොමු අංකය: IR/10/49/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශවයක් වශයෙන්,

එස්. විතානාච්චි මයා ඇතුළු සේවකයින් 47 දෙනා, 'කෙත්සිරි' තිබ්බොටුවාව, කහදූව.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්,

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

වත්තල, හැඳල, නිමල මරියා මාවත, අංක. 33/2 හි, පාලිත වීරසේකර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 ජනවාරි මස 08 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/49/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

එස්. විතානාච්චි මයා ඇතුළු සේවකයින් 47 දෙනා, "කෙත්සිරි", තිබ්බොටුවාව, කහදූව.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ –**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විශේෂ ශ්‍රේණියේ ට්‍රාන්ස්ෆර් දොඹකර ක්‍රියාකරු හෝ 1 වන ශ්‍රේණියේ ට්‍රාන්ස්ෆර් දොඹකර ක්‍රියාකරු ලෙස පත් කිරීමේ දී එස්. විතානාච්චි මහතා ඇතුළු අමුණා ඇති උපලේඛනයේ නම් සඳහන් සේවකයින් හතලිස් හත් (47) දෙනා හට එකී තනතුරු නියමිත කාල වකවානු වලදී නොදීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදුවීද? එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් ඔවුන්ට ලැබිය යුතු සහන කවරේද?

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

### උපලේඛනය

01. එස්. විතානාච්චි
02. පී. ඒ. ඩී. සරණපාල
03. ඩබ්. ඩී. ගුණරත්න
04. පී. ඩී. දයාසේන
05. ජී. මුනිදාස පීරිස්
06. එම්. ඒ. ප්‍රේමජයන්ත
07. එල්. කේ. පියසේන
08. පී. ඩී. එච්. රත්නසිරි
09. ඩබ්. ඒ. ජී. ප්‍රනාන්දු
10. එච්. ඒ. ජයතිරත්න
11. එස්. එම්. ඒ. ආනන්ද ප්‍රේමලාල්
12. ඊ. ඒ. සරත්
13. ඩී. අයි. මෙන්ඩිස්
14. එච්. ඩී. යසදාස
15. එච්. කුමාරදාස ද සිල්වා
16. එස්. ඩී. ලෙස්ලි
17. ඩබ්. එස්. එච්. ප්‍රනාන්දු
18. ජේ. එම්. ඩී. එස්. ඒ. ජයරත්න
19. එස්. ඩී. සුනිල්
20. ආර්. ඒ. සෝමවීර
21. වී. පී. කේ. රන්ජන් ශාන්ත
22. එච්. ජී. ඒ. ඉන්ද්‍රානන්ද
23. එච්. ඒ. විජේසේන
24. ඩබ්. ඒ. එස්. ජී. විජේසූරිය
25. එම්. එස්. ප්‍රනාන්දු
26. ඩී. පී. එල්. ඩබ්. බණ්ඩාර
27. යූ. ජී. එන්. එස්. පතිරණ
28. ජේ. එම්. ඩී. කිව්. ඇන්තනි
29. ඒ. ජී. එල්. පෙරේරා
30. බී. එම්. ලෙස්ලි ප්‍රේමලාල්
31. බී. ආර්. ද සිල්වා
32. පී. එම්. එල්. සිල්වා
33. පී. එච්. රත්නසිරි
34. ඒ. එල්. වික්‍රමාරච්චි
35. ඩී. එම්. ඒ. චන්ද්‍රතිලක
36. පී. නිමල් පෙරේරා
37. ඩබ්. ජී. ඥානදාස
38. ඩබ්. කේ. ඒ. ඒ. විජේසිංහ
39. වී. එන්. සොයිසා
40. ඊ. ඒ. නිහාල්
41. ඩබ්. ඩී. අයි. ප්‍රනාන්දු
42. එම්. රන්ජන්
43. එන්. කුමාරසිංහ
44. ඩී. එම්. ඒ. දිසානායක
45. ජී. ඩී. ජේ. සිල්වා
46. ජේ. පී. එස්. විජේසිංහ
47. ඩබ්. ඒ. ඩී. එස්. පුෂ්පකුමාර

02 - 42/2

මගේ යොමු අංකයඃ IR/19/04/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ඩබ්. වී. ඩී. හරිස්චන්ද්‍ර මයා, අංක 97/1, මහියංගන පාර, බදුල්ල.

සහ

හලාවත වැවිලි සමාගම, අංක 320, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වැනි කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

කොළඹ 08, මාතා පාර, මැනිං ටවුන් නිවාස යෝජනා ක්‍රමය, බී9 හි එන්. ඒ. ජයවික්‍රම මහත්මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 ජනවාරි මස 08 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකයඃ IR/19/04/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩබ්. වී. ඩී. හරිස්චන්ද්‍ර මයා, අංක 97/1, මහියංගන පාර, බදුල්ල.

සහ

හලාවත වැවිලි සමාගම, අංක 320, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

හලාවත වැවිලි සමාගමේ සේවයේ නියුතුව සිටියදී ඩබ්. වී. ඩී. හරිස්චන්ද්‍ර මහතාගේ සේවය අත්හිටුවීම, විනය පරීක්ෂණයක් පවත්වා තීරණ ගැනීම සඳහා මාස දහඅට (18)ක කාලයක් ගතවීම හේතුවෙන් පැමිණිලිකරුට අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න හා එසේ වූයේ නම් එම කාලය සඳහා අදාල හිඟ වැටුප්, කම්කරු දීමනා හා කොටස් ලාභ දීමනා ඔහුට ද හිමිවිය යුතුද? නැතහොත් ඔහුට හිමිවිය යුතු වෙනත් සහන මොනවාද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

02 - 43

මගේ යොමු අංකය: IR/10/28/2011.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත් වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම.

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියැවෙන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2012 ජූලි මස 23 වැනි දින අංක 1768/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012 ජුනි මස 22 වැනි දින දරන නියෝගයෙන්,

එක් පාර්ශවයක් වශයෙන්,

1. ඩබ්. එම්. ධනසූරිය මයා, අංක 310/බී, වලව්වත්ත, තන්තිරිමුල්ල, පානදුර.
2. ඒ. එම්. ද සොයිසා මයා, අංක 14, බෝධිරුක්ඛාරාම පාර, වැල්ලවත්ත.
3. කේ. ඩී. ග්‍රේෂන් පෙරේරා මයා, අංක 70/5, ජින්තුපිටිය වීදිය, කොළඹ 13.
4. ඊ. එම්. ජේ. පී. ඒකනායක මයා, අංක 28/බී/4/11, සියනෑ උයන, යක්කල.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්,

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර පවත්නා 2012 මැයි මස 04 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එම්. ඩී. කේ. කුලතුංග මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය වන ගාමිණී ලොකුගේ වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2012 ජුනි මස 22 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 දෙසැම්බර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

02-44/1

මගේ යොමු අංකය: IR/10/28/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශවයක් වශයෙන්,

1. ඩබ්. එම්. ධනසූරිය මයා, අංක 310/බී, වලව්වත්ත, තන්තිරිමුල්ල, පානදුර.
2. ඒ. එම්. ද සොයිසා මයා, අංක 14, බෝධිරුක්ඛාරාම පාර, වැල්ලවත්ත.
3. කේ. ඩී. ග්‍රේෂන් පෙරේරා මයා, අංක 70/5, ජින්තුපිටිය වීදිය, කොළඹ 13.
4. ඊ. එම්. ජේ. පී. ඒකනායක මයා, අංක 28/බී/4/11, සියනෑ උයන, යක්කල.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්,

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

කොළඹ 08, මාතා පාර, මැනිං ටවුන් නිවාස යෝජනා ක්‍රමය, අංක බී9 හි, එන්. ඒ. ජයවික්‍රම මහත්මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

මගේ යොමු අංකයඃ IR/10/28/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශවයක් වශයෙන්,

1. ඩබ්. එම්. ධනසූරිය මයා, අංක 310/බී, වලව්වත්ත, තන්තිරිමුල්ල, පානදුර,
2. ඒ. එම්. ද සොයිසා මයා, අංක 14, බෝධිරුක්ඛාරාම පාර, වැල්ලවත්ත.
3. කේ. ඩී. ග්‍රේෂන් පෙරේරා මයා, අංක 70/5, ජින්තුපිටිය වීදිය, කොළඹ 13.
4. ඊ. එම්. ජේ. පී. ඒකනායක මයා, අංක 28/බී/4/11, සියනෑ උයන, යක්කල.

සහ

අනෙක් පාර්ශවය වශයෙන්,
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ඩබ්. එම්. ධනසූරිය, ඒ. එම්. ද සොයිසා, කේ. ඩී. ග්‍රේෂන් පෙරේරා සහ ඊ. එම්. ජේ. පී. ඒකනායක යන ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කළ මහත්වරුන්ගේ, සුභසාධන සංගමයේ ඇති වූවා යැයි කියන අක්‍රමිකතාවයක් හේතුවෙන් ඔවුන්ගේ සේවය වැටුප් රහිතව අත්හිටුවීම යුක්ති සහගත වන්නේද? එසේ නොවන්නේ නම් ඔවුනට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

02 - 44/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.